අභ්‍යන්තර චක්‍රලේඛ: 13/2024

මගේ අංකය: DoME/01/10/08/ (2024)

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2024.09.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්ත,

වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී / ව්‍යාපෘති නිලධාරීන්
මානව සම්පත් සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරීන් වෙත.

**<u>විධිමත් පරිදි කාර්ය මණ්ඩලය තුලනය කිරීම.</u>**

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන යථෝක්ත නිලධාරීන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ යෙදවීම සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. දෙපාර්තමේන්තුවේ අනුමත ආශ්‍රිත නිලධාරි සේවා ගණයට අයත් කාර්ය මණ්ඩලය සම්පූර්ණ වී ඇති නමුදු, හඳුනාගත් දිස්ත්‍රික් කිහිපයක දැඩි නිලධාරි හිඟයක් පවතින බව දිගින් දිගටම නිරීක්ෂණය විය. ඇතැම් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල අතිරික්ත නිලධාරීන් සිටින අතර ඇතැම් ප්‍රාදේශිය ලේකම් කාර්යාල පුරප්පාඩු වී ඇති බැවින් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සිදු කරවා ගැනීමේදී ඇති වූ අසීරුතාවයන් මඟ හරවා ගැනීමට කාර්ය මණ්ඩලය පහත පරිදි තුලනය කිරීමට කටයුතු කරනු ලැබේ.

I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 දක්වා ඇති දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නිලධාරීන් 04 යි.
II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20ට වැඩි දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නිලධාරීන් 05 යි.
III. ග්‍රාම නිලධාරී වසම් 40 දක්වා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිලධාරීන් 01 යි.
IV. ග්‍රාම නිලධාරී වසම් 40ට වැඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිලධාරීන් 02 යි.(දිස්ත්‍රික්කය තුළ **පුරප්පාඩු නොපවතින්නේ නම් පමණක්)**

03. ඉහත 02 යටතේ කෙසේ සඳහන් වුවත් සේවා අවශ්‍යතාවය හා නිලධාරීන් සංඛ්‍යාව මත නිලධාරින් ස්ථාන ගත කිරීම් සිදුකිරීමට සිදුවන බැවිද කාරුණිකව දැනුම් දෙමි.

**කේ.ජී.එච්.එච්.ආර් කිරිඇල්ල**
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

**දුරකථන අංකය : 0112187160**

**ඊ- තැපැල : kiriellaruwan@gmail.com**